සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 07 - 2019

නම/විභාග අංකය : ........................................ ගණිතය කාලය: පැය 02 යි.

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 2 බැගින් හිමි වේ.

(1) දී ඇති රූපයේ සමමිති අක්ෂ සියල්ල ම ඇඳ දක්වන්න.



(2) $135^0$ අගය අයත් වන කෝණ වර්ගය ලියන්න.

..........................................................................................................................................

(3) $(-2) + (+2)$ හි අගය ලියන්න.

..........................................................................................................................................

(4) $1.2 + 3.45$ එකතු කරන්න.

..........................................................................................................................................

(5) දාරයක දිග 1 cm වන ඝනක හැඩති දාදු කැට 7 ක් තබා ඇති ආකාරය රූපයේ දක්වේ මෙම ඝන වස්තුවේ පරිමාව සොයන්න.



..........................................................................................................................................

(6) පහත දක්වෙන ප්‍රකාශ අතරින් කුලකයක් දක්වෙන ප්‍රකාශ ඉදිරියෙන් (✓) යොදන්න.

(i) ලෝකයේ දිග ගංගා ( )

(ii) 1 - 10 අතර ප්‍රථමක සංඛ්‍යා ( )

(iii) දේදුන්නේ වර්ණ ( )

(7) රූපයේ දක්වෙන වෘත්තයේ

(i) කේන්ද්‍රය

(ii) විෂ්කම්භය නම් කරන්න.




..........................................................................................................................................

(8) $0.25$ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

..........................................................................................................................................

(9) 07 ශ්‍රේණියේ සිසුන්ට බෙදා දුන් පොත් නිරූපනය සඳහා අඳින ලද චිත්‍ර ප්‍රස්තාරයක  = 8 ලෙස දක්වා ඇති නම්,  මගින් නිරූපනය වන පොත් ප්‍රමාණය කොපමණ ද?

..........................................................................................................................................

(10) දී ඇති සමපාද ත්‍රිකෝණය මගින් සවිධි ෂඩාස්‍රයක් නිර්මාණය කළ විට, ලැබෙන ෂඩාස්‍රයේ පරිමිතිය සොයන්න.




.............................................................................................................

(11) කාසියක් උඩ දැමූ විට ලැබෙන ප්‍රතිඵල සියල්ල ලියන්න.

.............................................................................................................

(12) $125 = \square^{\square}$ මගින් 125 දර්ශක ආකාරයෙන් ඇත. හිස්කොටුවලට ගැලපෙන ඉලක්කම් ලියන්න.

(13) $1\frac{1}{4}$ විෂම භාගයක් ලෙස දක්වන්න.

.............................................................................................................

(14) $x = 2$ ද $y = 4$ ද නම් $3x^2y$ හි අගය සොයන්න.

.............................................................................................................

(15) ජලය $40\ell$ අඩංගු ජල බඳුනකින් $750m\ell$ ලෙස සටහන් කර ඇති බෝතල් 10 ක් පුරවා ගත්තේ නම් බඳුනේ ඉතිරි ජල ප්‍රමාණය සොයන්න.

.............................................................................................................

(16) $2x - 1 = 5$ විසඳන්න.

.............................................................................................................

(17) $9 - 2 \times 4$ සුළු කරන්න.

.............................................................................................................

(18) පැය 1 හා මිනිත්තු 30 අනුපාතයක් ලෙස දක්වන්න.

.............................................................................................................

(19) 6, 8 යන සංඛ්‍යා යුගලෙහි මහා පොදු සාධකය සොයන්න.

.............................................................................................................

(20) දී ඇති ත්‍රපීසියමේ ඇති සමාන්තර රේඛා යුගල නම් කරන්න.




.............................................................................................................

## II කොටස

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පමණක් පිළිතුරු සපයන්න.
  (පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමි වේ)

(1) වීර මහා විද්‍යාලයේ 7 ශ්‍රේණියේ සමාන්තර පන්තිවල සිටින සිසුන් පිළිබඳ රැස්කරගත් තොරතුරු වගුවේ දැක්වේ.

| පන්තිය | සිසුන් ගණන | |
|---|---|---|
| | පිරිමි | ගැහැණු |
| 7A | 12 | 20 |
| 7B | 16 | 16 |
| 7C | 20 | 24 |
| 7D | 12 | 08 |

ඒ සඳහා අඳින ලද අසම්පූර්ණ බහු තීර ප්‍රස්තරය පහත දැක්වේ.




(i) බහුතීර ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න. (ලකුණු 6)

(ii) වැඩිම සිසුන් පිරිසක් සිටින පන්තිය කුමක් ද? (ලකුණු 2)

(iii) පන්ති හතරේම සිටින මුළු ගැහැණු ළමයි ගණන කොපමණ ද? (ලකුණු 2)

(iv) 7D පන්තියේ සිසුන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයන් හදාරණ අතර ඔවුන් සඳහා බෙදා දීමට අභ්‍යාස පොත් 300 ක් ලැබුණි. එම පොත් සමසේ බෙදුවේ නම් එක් අයෙකුට ලැබෙන පොත් ප්‍රමාණය සොයන්න. (ලකුණු 3)

(v) 7B පන්තියේ සිටින ගැහැණු ළමයි එම පන්තියේ සිටින මුළු සිසුන්ගෙන් කවර ප්‍රතිශතයක් ද? (ලකුණු 3)

(2) (i) $x$ අක්ෂය දිගේත් $y$ අක්ෂය දිගේත් 0 සිට 7 තෙක් වන කාටිසීය තලයක් අඳින්න. (ලකුණු 2)

(ii) පහත දී ඇති ලක්ෂ්‍ය එම කාටිසිය තලය මත ලකුණු කර සරල රේඛීය සංවෘත රූපයක් ලැබෙන සේ ඒවා පිළිවෙලින් යා කරන්න. (ලකුණු 3)

A = (2, 2)  B = (2, 7)  C = (7, 2)

(iii) ලැබෙන රූපයේ නම ලියන්න. (ලකුණු 2)

(iv) එම රූපයට *a)* පාද අනුව
*b)* කෝණ අනුව භාවිතා කරන සුවිශේෂී නම් ලියන්න. (ලකුණු 2)

(v) මෙම රූපය ඇතුළත ඇති $x$ අගය $y$ අගයට වඩා වැඩි වන ලක්ෂ්‍යයක ඛණ්ඩාංක ලියන්න. (ලකුණු 2)

(3) (a) (i) ශුද්ධ ටෙසලාකරණයක් සඳහා යොදා ගත හැකි සවිධි තල රූප 2 ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) සුදුසු තල රූප 2 ක් භාවිතා කර අර්ධ ශුද්ධ ටෙසලාකරණයක් නිර්මාණය කරන්න. (ලකුණු 2)

(iii) සරල රේඛීය තල රූප භාවිතයෙන් කරනු ලබන ටෙසලාකරණවල ශීර්ෂ ලක්ෂ්‍යක් වටා කෝණවල එකතුව කීයද? (ලකුණු 2)

(b) (i) පාද 6 ක් ඇති අවතල බහු අස්‍රයක් අඳින්න. (ලකුණු 2)

(ii) රූපයේ දක්වා ඇති තල රූපය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් ✗ ලකුණ ද යොදන්න.



(a) උත්තල බහු අස්‍රයකි ( )

(b) අවතල බහුඅස්‍රයකි ( )

(c) සවිධි බහු අස්‍රයකි ( ) (ලකුණු 3)

(4)




(a) (i) රූපයේ දී ඇති ආකෘතිය භාවිතා කර සෑදිය හැකි ඝන වස්තුව කුමක් ද? (ලකුණු 1)

(ii) අඳුරු කර ඇති කොටස්වල ප්‍රයෝජනය කුමක් ද? (ලකුණු 1)

(iii) එහි ඇති මුහුණත්, ශීර්ෂ, දාර සංඛ්‍යාව ලියන්න. (ලකුණු 3)

(iv) ඉහත අගයන් ඔයිලර් සම්බන්ධයට ගැලපෙන බව පෙන්වන්න. (ලකුණු 2)

(v) ඉහත සාදන ලද ඝන වස්තු දෙකක් සමචතුරස්‍ර මුහුණත් එකට සිටින සේ ඇලවූ විට ලැබෙන ඝනවස්තුවේ ඇති මුහුණත් ගණන ලියන්න. (ලකුණු 2)

(vi) ඉහත රූපයේ P හා Q මගින් දක්වා ඇති තල රූප නම් කරන්න. (ලකුණු 2)

(5) (i) කේන්ද්‍රය O වූ ද අරය 4cm වූ වෘත්තයක් නිර්මාණය කරන්න. (ලකුණු 2)

(ii) එම වෘත්තය මත ශීර්ෂ පිහිටන සේ සවිධි ෂඩාස්‍රයක් නිර්මාණය කර එහි ශීර්ෂ A, B, C, D, E, F ලෙස පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 4)

(iii) එම සවිධි ෂඩාස්‍රයේ පරිමිතිය සොයන්න. (ලකුණු 2)

(iv) B හා E ලක්ෂ්‍යය යා කරන්න. (ලකුණු 1)

(v) ABEF තල රූපය සඳහා සුදුසු නමක් යෝජනා කරන්න. (ලකුණු 2)

(6) ක්‍රීඩිකාවන් දෙදෙනෙකු පළාත් ක්‍රීඩා තරඟ පුහුණුව සඳහා දින 2 දී ධාවනය කළ දුර ප්‍රමාණ පහත දැක්වේ.

(a)

| දවස \ නම | අමාෂා | කවීෂා |
|---|---|---|
| සෙනසුරාදා | 1km 200m | 1km |
| ඉරිදා | 2km 400m | 2km 200m |

(i) ඉරිදා දින කවීෂා ධාවනය කළ දුර මීටර් වලින් ලියන්න. (ලකුණු 1)

(ii) අමාෂා සෙනසුරාදා දිනට වඩා ඉරිදා දින කොපමණ දුරක් ධාවනය කර තිබේද? (ලකුණු 2)

(iii) කවීෂා දින දෙක තුළ ධාවනය කළ මුළු දුර සොයන්න. (ලකුණු 2)

(b) (i) ක්‍රීඩිකාවන් දෙදෙනාට අවශ්‍ය දෑ ලබා ගැනීමට රු. 5000 ක් ආධාර වශයෙන් ලැබුණි. අමාෂා හා කවීෂා අතර 2 : 3 අනුපාතයට එම මුදල බෙදා දුන්නේ නම් එක් එක් අයට ලැබෙන මුදල වෙන වෙනම සොයන්න. (ලකුණු 3)

(ii) රිදී හා තඹ 4 : 3 අනුපාතයට මිශ්‍ර කිරීමෙන් සාදා ගත් ලෝහ කුසලාන ජයග්‍රාහී සිසුන්ට ලබා දෙන ලදී. කුසලානයේ ඇති තඹ වල ස්කන්ධය 18g ක් නම් එහි ඇති රිදීවල ස්කන්ධය සොයන්න.(ල. 3)

(7) 1 : 200 පරිමාණයට අඳින ලද ගොඩනැගිල්ලක බිම් සැලැස්මක් රූපයේ දැක්වේ. A හා B එහි කොටස් 2 කි.




(i) ඉහත පරිමාණයේ 1cm මගින් දැක්වෙන සැබෑ දිග කීය ද? (ලකුණු 1)

(ii) දී ඇති පරිමාණ රූපයේ ගොඩනැගිල්ලේ බිමෙහි වර්ගඵලය සොයන්න. (ලකුණු 2)

(iii) පරිමාණ රූපයේ B කොටසේ වර්ගඵලය සොයන්න. (ලකුණු 2)

(iv) පරිමාණ රූපයේ A කොටසේ වර්ගඵලය සොයන්න. (ලකුණු 2)

(v) B කොටසේ සැබෑ දිග හා පළල සොයන්න. (ලකුණු 4)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 07 - 2019

### ගණිතය - පිළිතුරු පත්‍රය

### I කොටස

(1)  ---------- 2

(2) මහා කෝණ ---------- 2

(3) 0 ---------- 2

(4) 4.65 ---------- 2

(5) 7 $cm^3$ ---------- 2
ඒකක නොමැති නම් ---------- 1

(6) (i) ( ✗ )
(ii) ( ✓ )
(iii) ( ✓ ) ---------- 2
එක වැරැද්දක් ඇත්නම් ---------- 1

(7) (i) 0 ---------- 1
(ii) AB ---------- 1 - 2

(8) $\frac{25}{100} = 25\%$ ---------- 2

(9) 30 ---------- 2

(10) 36 cm ---------- 2

(11) *සිරස ලැබීම, අගය ලැබීම* ---------- 2

(12) 3 ---------- 1
5 ---------- 1 - 2

(13) $\frac{5}{4}$ ---------- 2

(14) $3 \times x \times x \times y$ ---------- 2
$3 \times 2 \times 2 \times 4$ ---------- 1
48 ---------- 1

(15)

| ℓ | mℓ |
|---|---|
| 40 | 000 |
| - 7 | 500 |
| 32 | 500 |

හෝ ---------- 2
32.5 ℓ
(7 ℓ 500 mℓ ලබා ගැනීමට ) ---------- 1

(16) $2x - 1 + 1 = 5 + 1$
$2x = 6$ ---------- 1
$x = 3$ ---------- 1 - 2

(17) 9 - 8 ---------- 1
1 ---------- 1 - 2

(18) 60 : 30 ---------- 1
2 : 1 ---------- 1 - 2

(19) $6 = 2 \times 3$
$8 = 2 \times 2 \times 2$
ම. පො. සා. = 2 ---------- 2
හෝ වෙනත් ක්‍රම සඳහා

(20) AB හා DC ---------- 2
(2 හෝ 0)

# II කොටස

| Question | Answer | Marks | Total |
|---|---|---|---|
| (1) (i) | ප්‍රස්තාරය සම්පූර්ණ කිරීමට $1\times 6$ | | 6 |
| (ii) | 7C | | 2 |
| (iii) | 68 | | 2 |
| (iv) | $300 \div 20$ | 1 | 1 |
| | 15 | 1 | 2 |
| (v) | $\frac{16}{32}=\frac{1}{2}$ | 1 | |
| | $\frac{1\times 50}{2\times 50}=\frac{50}{100}=50\%$ | | 3 |
| | | | 16 |

| Question | Answer | Marks | Total |
|---|---|---|---|
| (2) (i) | නිවැරදි කාටිසීහ තලය ඇඳීම | | 2 |
| (ii) | ලක්ෂ්‍ය ලකුණු කිරීම හා පිළිවෙලින් යා කිරීම | | 3 |
| (iii) | ත්‍රිකෝණයට | | 2 |
| (iv) | $a$ - සමද්විපාද ත්‍රිකෝණ | 1 | |
| | b - සෘජුකෝණික ත්‍රිකෝණය | 1 | 2 |
| (v) | නිවැරදි ඛණ්ඩාංකයක් සඳහා | | 2 |
| | | | 11 |

| Question | Answer | Marks | Total |
|---|---|---|---|
| (3) (a) (i) | නිවැරදි තල රූප 2 ක් සඳහා | | 2 |
| (ii) | අර්ධ ශුද්ධ ටෙසලාකරණය නිර්මාණය | | 2 |
| (iii) | $360^0$ | | 2 |
| (b) (i) | ඇඳීම සඳහා | | 2 |
| (ii) | a - ✓ | | |
| | b - ✗ | | |
| | c - ✗ | | 3 |
| | | | 11 |

| Question | Answer | Marks | Total |
|---|---|---|---|
| (4) (a) (i) | සමචතුරස්‍ර පිරමීඩය | | 1 |
| (ii) | ඇලවීම / සම්බන්ධ කිරීම | | 1 |
| (iii) | මුහුණත් - 5 | 1 | |
| | ශීර්ෂ - 5 | 1 | 3 |
| | දාර - 8 | 1 | |
| (iv) | මුහුණත් + ශීර්ෂ = දාර + 2 | | 2 |
| | 5 + 5 = 8 + 2 | | |
| | 10 = 10 | | |
| | ගැලපේ | | |
| (v) | 8 | | 2 |
| (vi) | P - සමචතුරස්‍රය | 1 | |
| | Q - සමපාද ත්‍රිකෝණය | 1 | 2 |
| | | | 11 |

| Question | Answer | Marks | Total |
|---|---|---|---|
| (5) (i) | වෘත්තය නිර්මාණය | | 2 |
| (ii) | ෂඩාස්‍රය නිර්මාණය | 3 | |
| | නම් කිරීම | 1 | 4 |
| (iii) | 24 cm | | 2 |
| (iv) | යා කිරීම | | 1 |
| (v) | ත්‍රපීසියම | | 2 |
| | | | 11 |

| Question | Answer | Marks | Total |
|---|---|---|---|
| (6) (a) (i) | 2200 m | | 1 |
| (ii) | km m: 2 400 − 1 200 = 1 200 | | |
| | 1km 200m | | 2 |
| (iii) | km m: 1 000 + 2 200 = 3 200 | | |
| | 3k 200m | | 2 |
| (b) (i) | අමාෂා : කවීෂා = 2 : 3 | | |
| | $\frac{2}{5}$, $\frac{3}{5}$ 5 න් බෙදීමට | 1 | |
| | අමාෂාට $=\frac{5000}{5}\times 2$ | 1 | |
| | $= 1000 \times 2 = 2000$ | | 3 |
| | කවීෂා $= 1000 \times 3$ | | |
| | = රු 3000 | 1 | |
| (ii) | රිදී : තඹ = 4 : 3 | | |
| | 24g 18g | | |
| | 24g ලබා ගැනීමට | | 3 |
| | | | 11 |

| Question | Answer | Marks | Total |
|---|---|---|---|
| (7) (i) | 2 m | | 1 |
| (ii) | $12\text{ cm} \times 8\text{ cm}$ | | |
| | $96\text{ cm}^2$ | | 2 |
| (iii) | $6\text{ cm} \times 4\text{ cm}$ | | |
| | $24\text{ cm}^2$ | | 2 |
| (iv) | $96\text{ cm}^2 - 24\text{ cm}^2$ | 1 | |
| | $72\text{ cm}^2$ | 1 | 2 |
| (v) | දිග $= 6 \times 2 = 12$ m | 2 | |
| | පළල $= 4 \times 2 = 8$ m | 2 | 4 |
| | | | 11 |